කොමිෂන් සභා චක්‍රලේඛ අංක:13/94.

බප/සසේකො/ච,
සමුපකාර සේවක කොමිෂන් සභාව,
(බස්නාහිර පළාත),
මහ ලේකම් කාර්යාලය,
3 වන මහල, මාලිගාවත්ත,
කොළඹ - 10. 1994.12.13 දින.

බස්නාහිර පළාතේ සියළුම සමුපකාර සමිතිවල සභාපතිවරුන් වෙත.

සමුපකාර සේවකයන්ට පාරිතෝෂිත දීමනා ගෙවීම.

උක්ත කාරණයට අදාලව නිකුත් කර ඇති, 1994.07.07 දින දරණ අංක:5/94 දරණ කොමිෂන් සභා චක්‍ර ලේඛයට වැඩිමනත්වයි.

02. එම චක්‍රලේඛයේ ප්‍රකාර පාරිතෝෂිත දීමනා ගණන් බැලීමේ දී අදාල සේවකයා ලබා ගත් වැටුප වශයෙන් සැලකිය යුත්තේ, දීමනා රහිත ඒකාබද්ධ වැටුප බවත්, ඊට 1991.05.06 දිනැති අංක: 191/91 දරණ චක්‍රලේඛණයෙන් නියමිත රු:300/= වැඩි වීමද, ඒකාබද්ධ වැටුපට ඇතුලත් විය යුතු බවත්,

03. කැලි ගණන්වලට වැඩ කර පසුව අනියම් හෝ තාවකාලික පත්වීමක් ලබා ඇති සේවකයන්ගේ සේවා කාලය ගණනය කිරීමේ දී එම සියළුම සේවා කාලයත් ගණන් ගත යුතු බවත්, කොමිෂන් සභාවේ නියමය පරිදි දන්වමි.

(පී.ඩී.චන්ද්‍රදාස),
ලේකම්,
බස්නාහිර පළාතේ සමුපකාර සේවක කොමිෂන් සභාව.

පිටපත්:- (1). ලේකම් - කෘෂිකර්ම, පළාත් පරිපාලන හා සමුපකාර අමාත්‍යාංශය(බ.ප.).
(2). සමුපකාර සංවර්ධන කොමසාරිස් (බ.ප.).